C
376

# ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන අපේක්ෂණ පිළිබඳ

# තරා විශ්ලේෂණයක්.

එල්.එන්.කරුණාසේන.

ශාස්ත්‍රවේදී (ලංකා); අධ්‍යාපන ඩිප්ලෝමා

අධ්‍යාපන ශාස්ත්‍රපති පරීක්ෂණයේ

අර්ධ පුරණයක් වශයෙන්

පේරාදෙණිය විශ්ව විද්‍යාලයට

ඉදිරිපත් කෙරෙණ පරියේෂණ

නිබන්ධනයයි.

1981

356504

නිබන්ධන උපදේශක:-

ආචාර්ය එම්. උපාලි සේදර,

අධ්‍යාපන විද්‍යා අංශය,

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය,

පේරාදෙණිය.

පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පුස්තකාලය
1982-11-18
පේ රා දෙ ණි ය.

356504

## සාරාංශය.

ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපනයේ වෙනස්කම් සිදුවූයේ සාමාන්‍ය අධ්‍යාපනයටත් වඩා බොහෝ සෙමින්ය. නමුත් විය යුතුව තිබුණේ මෙහි විරුද්ධ පැත්තයි. එනම් සාමාන්‍ය අධ්‍යාපනයට වඩා සීඝ්‍රයෙන් ගුරු අධ්‍යාපනයේ වෙනස්කම් ඇති කිරීමයි. ගුරු අධ්‍යාපනය පිළිබඳ වරින් වර යම් යම් ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් වුවත් ගුරු අධ්‍යාපන වැඩ මාලාව තුළින අරමුණු පදනම් කොට ගෙන කෙබඳු ආකාරයකට සැලසුම් කළ යුතුද යන්න මෙතෙක් සුවිශේෂීව සලකා ඇති බවක් නොපෙනේ. මෙම තත්වය අනුව ගුරු අධ්‍යාපන අපේක්ෂණ මාලාවක් පර්යේෂණාත්මකව ගොඩනැගීමත් ගුරු අධ්‍යාපනයේ නියැලෙන්නන් ගේ අදහස් උදහස් අනුව එහි වැදගත් නොවැදගත් කම් නිර්ණය කිරීමත් කාලෝචිතයැයි සැලකිණ.

ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන අපේක්ෂණ පිළිබඳ තරා විශ්ලේෂණයක යෙදෙන මෙම පර්යේෂණයේදී විෂයමාලා තඥයන්ද, මහනුවර ප්‍රදේශයේ ගුරු විද්‍යාලයීය කථිකාචාර්ය වරුන්ද, සිසු ගුරු පිරිස්ද, පාසැල්වල ඉගැන්වීමේ යෙදී සිටින පුහුණුවූ ගුරු පිරිස්ද, පේරාදෙණිය විශ්ව විද්‍යාලයයේ උපාධි අපේක්ෂක ගුරු පිරිස්ද යන නියැදීන් පර්යේෂණ කාර්යයේදී යොදා ගැණින.

ගුරු අධ්‍යාපනය පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ලිඛිත ලිපි ලේඛන විමර්ශනයට ලක් කිරීමෙන්ද, ගුරු අධ්‍යාපනය හා බැඳි පිරිස් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන්ද,, සිසු ගුරුවරුන් ලවා වගන්ති ගත කරමින ලද ගුරු අධ්‍යාපන අපේක්ෂණ විමසා බැලීමෙන්ද, යන පිලිවෙත් ඔස්සේ පර්යේෂණාත්මකව ගොඩ -නගාගත් වඩා වලංගුතාවයකින් යුත් ගුරු අධ්‍යාපන අපේක්ෂණ මාලාවක්; ඉහත දැක්වූ නියැදීන් යොදා ගෙන සංඛ්‍යාන විද්‍යාත්මක විශ්ලේෂණයකට ලක් කොට ලත් පරිමාණික අගයයන්ට අනුකූලව තරා ගත කොට පෙළ ගසා ඉදිරිපත් කර ඇත.

ඒ ඒ නියැදීන් පැවරූ තරා පිලිවෙත් අතර සහසම්බන්ධතා සංගුණක වටිනාකම් අනුව ගුරු අධ්‍යාපන අපේක්ෂණයන් හා බැඳි එකඟතාවයන්ද, Zr වටිනාකම් අනුව වෙනස්කම්ද, විවරණය කොට දැක්වෙයි. මෙහිදී ස්ත්‍රී- පුරුෂ භාවය හා විවිධ පාඨමාලා සැලකිල්ලට ගෙන ඇත. ඒ අනුව පහත දැක්වෙන තොරතුරු අනාවරණය වෙයි.

මුළු නියැදිය තුළ අන්තර්ගත නියැදීන්ගෙන් සෑම නියැදීන් දෙකක් අතරම ආසන්න වශයෙන් 0.80 ක තරම්වූ ඉහල සහසම්බන්ධතාවක් පෙන්නුම් කිරීමෙන් ගුරු අධ්‍යාපන අපේක්ෂණ තරා කිරීමේදී සියළුම නියැදීන් අවශ්‍යයෙන්ම විග්‍රහ කළ හැකි පොදු තරය 64% ක් පමණ වන බව පැහැදිලි වේ.

356504

එමෙන්ම පුහුණු පාඨමාලා අතරද එබඳුම සංගතතාවයක් දක්වා ඇති අතර තරමක් හෝ අඩු සංගතතාවයක් පෙන්නුම් කර ඇත්තේ සමාජඅධ්‍යයන හා සෞන්දර්යය යන පාඨමාලා දෙකෙහිය.

පර්යේෂණය තුළ උපරිම සහසම්බන්ධතාවක් පෙන්නුම් කර ඇත්තේ පුහුණුලාභී ගුරු පිරිස් වන ඩිප්ලෝමා අපේක්ෂක ගුරුවරුන්, පුහුණුවූ ගුරු වරුන්, හා ගුරු විද්‍යාල ගතව පුහුණුවන ගුරුවරුන් අතරයි.

එකිනෙක නියැදීන් හී කාන්තාවන් හා පිරිමින් අතර ගුරු අධ්‍යාපන අපේක්ෂණ තරා කිරීමේ හොඳ එකඟතාවයක් පවතින අතර කාන්තාවන් අතර පවතින එකඟ කමට වැඩි එකඟතාවක් පිරිමි නියැදීන් අතර පවතී.

තරා විග්‍රහයේ අවසාන ප්‍රතිඵලයක් වශයෙන් ගුරු පෞරුෂයේ සාමාන්‍ය විබෝධය ඇති කිරීම; උපදේශන කුශලතා දියුණු කිරීම; විෂය බාහිර ක්‍රියාකාරකම් පිළිබඳ පරිචය ලබාදීම; ද්විතීයික මට්ටමේ ගුරු පෞරුෂ විබෝධය ඇති කිරීම; අධ්‍යාපනයේ ශාස්ත්‍රීය පදනම වටහාදීම; යනුවෙන් කාණ්ඩ පහකට ගුරු අධ්‍යාපන අපේක්ෂණ 36 වර්ග කොට විවරණය කොට ඇත. ඒ අනුව නියැදීන් සියල්ලම ප්‍රමුඛත්වයේ ලා අගය කොට ඇත්තේ ගුරු අධ්‍යාපනයේ ශාස්ත්‍රීය පදනමකට වඩා වෘත්තියමය පරිපූර්ණත්වයයි.

-- o --